**පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාව**

**කිලිනොච්චි දිස්ත්‍රික්කය**

**-----------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**----------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 24 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 18 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 18 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පච්චිලයිපල්ලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ සෝරන්පත්තිකුලම් සුසානභූමිය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු. 475,000ක් වියදම් ණයහිමි ගිණුමේ ප්‍රතිපාදන වෙන්කර තිබූ කාර්යය අවසන් නොවී පැවතියදී, ස්ථාවර වත්කම් ලෙස ගිණුම්වල දැක්වීම නිසා ගොඩනැගිලි ගිණුමේ වටිනාකම රු.475,000කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කර්මාන්තයෙන් සියයට 90ක් දැනට සම්පූර්ණ කර ඇත. | කර්මාන්තයන් නියමිත කාල පරාසයන් තුළ සම්පූර්ණ කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | කඩකාමර සඳහා ආපසු නොගෙවූ ලංසු තැන්පතු රු.151,100ක් ආදායම් ලෙස ගිණුම්වල නොදක්වා රජයේ පොදු තැන්පතු ශේෂයක් ලෙස දැක්වීම නිසා ආදායම් රු.151,100කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි. | දැන් ආදායමට මාරුකර ඇත. | ආදායම් නියමිත මූල්‍ය වර්ෂයේ අදාල ශීර්ෂයට අනුව දැක්විය යුතුවේ. |
| (iii) | ඉටු නොකළ සංගනි සුසානභූමි කර්මාන්තයට පසුගිය වර්ෂයේ වියදම් ණයහිමි ගිණුමේ දක්වා තිබූ රු.580,000ක් සමලෝචිත වර්ෂයේ අදාල කර්මාන්තයේ කාර්යයන් ඉටු නොකර සමුච්චිත අරමුදලට මාරු කර තිබූ නමුත් ජර්නල් සටහන් කිසිවක් මාර්ගයෙන් සිදු කර නොතිබුණි. | ගෙවීම් වවුචර් මගින් සමුච්චිත අරමුදලට මාරුකර මාසික ගිණුම් ප්‍රකාශනවල සටහන් කර සමුච්චිත අරමුදල් ගිණුමේ නිවැරදි කර ඇත. | පසුගිය වර්ෂයේ සිදුවීම් ජර්නල් සටහන් මාර්ගයෙන් නිවැරදි කළ යුතුවේ. |

## 1.4 අනුකූල නොවීම්

| | විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීතී, රීතී හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 945,944 | වර්ෂ 02 ක් ඉක්ම වූ කල් ඉකුත් වූ තැන්පතු 36 සම්බන්ධයෙන් ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඇතැම් තැන්පතු ආපසු ගෙවා ඇත. ඉතිරි තැන්පතු ආපසු ගෙවීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (අතිවිශේෂ) 1989 අප්‍රේල් 17 දිනැති 12 වැනි බහු කාර්ය බලපත්‍ර ගාස්තු විෂයයේ 75 වගන්තිය | - | සභාව විසින් වරිපනම් බදු ලෙස ලබාදුන් ව්‍යාපාරික ස්ථාන 08කට ව්‍යාපාර බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | අයකිරීමට කටයුතු කරනු ලැබේ. | ගැසට් පත්‍රයට අනුකූලව ක්‍රියාකළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2012 ජනවාරි 5 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 3.3 වගන්තිය | 1,190,000 | කොන්ත්‍රාත් පිරිනැමීමේදි සමාජ පදනමින් වූ ආයතනවලට කොන්ත්‍රාත් කාර්යයන් 03කට වැඩියෙන් නිරතවිය නොහැකි බව සඳහන් වේ. එනමුත්, ප්‍රජා මූල මධ්‍යස්ථානයකට ව්‍යාපෘති 05ක් මාස 03ක් ඇතුළත භාරදී තිබීම රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට පටහැනි ක්‍රියාවකි. | වෙනත් ප්‍රජා මූල සංවිධාන ඉදිරිපත් නොවීම නිසා භාරදී තිබුණි. ඉදිරියේදි ගිවිසුම් ලබාදෙනු නොලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත් සභාවේ පළාත් මූල්‍ය රීති 163.3(ii) | 4,709,367 | අත්තිකාරම් 12 ක් නිරවුල් කර නොතිබුණි. | අත්තිකාරම් 10ක් නිරවුල් කර ඇත. එසේම ඉතිරි අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර තිබුණි. | මූල්‍ය රීතීන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | අනෙකුත් චක්‍රලේඛ<br>---------------------<br>පළාත් පාලන කොමසාරිස්, උතුරු පළාත්ගේ 2016 ජූලි 25 දිනැති අංක 04/2016 දරන චක්‍රලේඛය | 1,719,617 | රාජ්‍ය ආදායම් අයකිරීම්, හිඟ හිටි අයකිරීම් පිළිබඳ මාසික ප්‍රකාශ - ප්‍රා.ස. 07 ගිණුම් වාර්තා මාසිකව සකස් කළ යුතු බවට සඳහන් වූවත්, සභාව විසින් ප්‍රා.ස - 07 සකස් කර නොතිබුණි. | මෙම වර්ෂයේ මාසිකව සකස් කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු.20,595,526 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 21,215,468 ක් විය.

### 2.2 මූල්‍ය පරිපාලනය

---------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා බැංකුවේ අංක C-2713 දරන ජංගම ගිණුමේ රු.17,453ක ශේෂය වර්ෂ 05කට අධික කාලයක සිට කිසිදු ඵලදායි ක්‍රියාමාර්ගයක් නොගෙන ඉදිරියට ගෙනා ශේෂයක් ලෙස පවත්වාගෙන තිබුණි. | අදාල ගිණුමේ ශේෂය අවසන් කර ජංගම ගිණුමට මාරුකිරීම සඳහා බැංකුවට ලිපි යවා ඇත. | ගිණුම් වසා දැමිය යුතුවේ. |

### 2.3 ආදායම් පරිපාලනය

----------------------

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | - | - | - | - | - | - |
| (ii) | කුලී | 4,284,722 | 5,332,209 | 233,434 | 3,458,724 | 4,395,050 | 332,510 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 432,500 | 523,216 | 1,500 | 434,500 | 835,464 | 8,200 |
| (iv) | වෙනත් ආදායම් | 45,066,571 | 54,678,424 | 1,484,683 | 46,910,356 | 23,378,957 | 4,935,862 |
| | | 49,783,793 | 60,533,849 | 1,719,617 | 50,803,580 | 28,609,471 | 5,276,572 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

--------------------------------------

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව එහි ආදායම් ලැයිස්තු ගත කර රැස්කිරීම සඳහා අවශ්‍ය ඵලදායී ක්‍රියාමාර්ග ගැනීමට පසුගිය වර්ෂ 10 ක සිට කටයුතු කර නොතිබුණි. | ආදායම් ලැයිස්තු අනුව අය කරනු ලැබේ. විධිමත්ව සකස් කිරීමට කටයුතු කර ඇත. | ආදායම් ලැයිස්තු ගත කර අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ රු.1,719,617ක් හිඟහිටි වශයෙන් ගිණුම්වල දක්වා තිබූ අතර මෙම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා වර්ෂ 1 සිට 7කට අධික කාලයක සිට ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රු.1,448,563ක් අයකර ගෙන ඇත. ඉතිරි හිඟ ශේෂ අයකිරීමට කටයුතු කරමින් පවතී. | නියමිත කාලයේදි හිඟ ආදායම් අයකිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | සභාවේ පුලෝප්පලෙයි උප කාර්යාලයේ හඳුනාගත නොහැකි ලැබිය යුතු ඉඩම් බදු රු.42,017ක් පසුගිය වර්ෂ 03කට අධික කාලයක් මූල්‍ය ප්‍රකාශනවල හිඟ ශේෂයක් ලෙස ඉදිරිපත් කර තිබූ අතර මේවා හඳුනාගෙන අයකර ගැනීමට ඵලදායි පියවර ගෙන නොතිබුණි. | අයකිරීමට කටයුතු කර ඇත. | නියමිත කාලයේදි හිඟ ආදායම් අයකිරීමට කටයුතු කළ යුතුවේ. |

**2.3.3 වරිපනම් හා බදු**

----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1989 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ III රීතියේ 32 වගන්තිය ප්‍රකාරව, සභාව විසින් සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු ආදායම් ඇස්තමේන්තු කර අයකිරීමට ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයකිරීමට කටයුතු කරමින් පවතී. | පනත අනුව ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 2.3.4 කුලී

-------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ---------------- | ----------------- |
| (අ) | ඉඩම් කුලී ගිවිසුමේ තාවකාලික අනුමැතිය ලබාදුන් කඩකාමර 23 වෙනුවට සිමෙන්තියෙන් තැනු ස්ථිර කඩකාමර, වෙනම විදුලි සම්බන්ධතාවයත් සහිතවුත්, කඩකාමර සඳහාත් ඉඩම් කුලි අයකළ ආකාරයටම කුලි අයකර තිබුණි. | කඩකාමර හිමියන් ගිවිසුම්වලට පටහැනිව ස්ථිර කඩකාමර ඉදිකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනිමින් පවති. | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවේ කුලි ගිවිසුමෙන් ඉදිකළ කඩකාමර 2ක් සහා අනුමැතියකින් තොරව උපබදු දී තිබුණි. | ක්‍රියාමාර්ග ගනිමින් පවති. | ගිවිසුම් ප්‍රකාරව උපබදු දීම සම්බන්ධයෙන් සුදුසු කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඉඩම් කුලියෙන් ඉදිකළ ව්‍යාපාර ස්ථානවලට සභාව විසින් සමාලෝචිත වර්ෂයට වරිපනම් බදු ඇස්තමේන්තු කර අයකිරීමට ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දැන් ක්‍රියාමාර්ග ගනිමින් පවති. | ව්‍යාපාර බලපත්‍ර නිකුත් කළ යුතුවේ. |

## 2.3.5 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ---------------- | -------------------- |
| පළාත් සභා ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ මුදල් රු.657,167 ක් සහ මුද්දර ගාස්තු රු.584,397 ක ලැබිය යුතුව තිබුණි. | ඉල්ලීම් ලිපි යවා ඇත. | නියමිත කාලය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, මූලික කාරණා 33ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර තිබිය යුතු වුවත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු අතුරු ව්‍යවස්ථාවක් සකස් කර නොතිබුණි. | දැනට අතුරු ව්‍යවස්ථා පිළිගෙන ගැසට් පත්‍රයේ ආදායම් විස්තර ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරමින් පවතී. | පනතේ ප්‍රකාරයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කළ යුතුය. |

(ආ) අතහැර දැමූ ව්‍යාපෘති

----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත කළ රු. මිලියන 2.3ක් වටිනා ව්‍යාපෘති 02කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබානොගෙන මෙහෙයුම් සම්පූර්ණයෙන් අත්හැර දමා තිබුණි. | ළමා උද්‍යාන ඉදිකිරීම ගම්පෙරළිය වැඩසටහනට ඇතුළත් කර ඇත. විවේකි ස්ථාන ඉදිකිරීම සඳහා සුදුසු දෙපාර්තමේන්තුවල අනුමැතින් ලබාගත යුතුව පැවැති හෙයින් සැලැසුම් වෙනස් කර කාර්යයන් ඉදිරියට කරගෙන යනු ලැබේ. | ඇස්තමේන්තු ප්‍රකාරව ව්‍යාපෘති ක්‍රියාත්මක කර නියමිත කාලය තුළ අවසන් කළ යුතුවේ. |

(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා අරමුදලින් ක්‍රියාත්මක කළ පිරිවැය රු.1,105,000ක ව්‍යාපෘති 04ක් ගිවිසුම් කාල සීමාව තුළ අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘති 03ක් දැනට අවසන් කර ඇති අතර එක් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙමින් පවතී. | ව්‍යාපෘති නියමිත කාලය තුළ අවසන් කළ යුතුවේ. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සභාවේ 2019 නොවැම්බර් 15 දිනැති අංක 24 දරන තීරණයෙන් ග්‍රාම සේවක වසම් වශයෙන් ප්‍රතිචක්‍රීකරණ අයිතයන් රැස්කිරීමේ දින සහ ස්ථාන පිළිබඳව තීරණය කර තිබුණත්, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියට යෙදවිය හැකි ආකාරයන් වාර්තා කරන දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාල විෂයය විධිමත්ව ක්‍රියාත්මක කිරීමට වැඩපිළිවෙලවල් යොදා ඇත. | තීරණ ප්‍රකාරව ක්‍රියා කළ යුතුවේ. |
| (ii) | සභා බල ප්‍රදේශයට අයත් අපද්‍රව්‍ය නිවාස, කඩකාමර, හෝටල්, එළවළු සහ පළතුරු විකුණුම් අලෙවි සැල්, මස් කඩ, කර්මාන්ත ශාලා, රෝහල්, පොදු ස්ථාන ආදියෙන් ලැබෙන අපද්‍රව්‍ය අදාල ස්ථානයට උචිත පරිදි ඝන අපද්‍රව්‍ය වෙන්කිරීමේ ක්‍රමවේදය අනුගමනය කර නොතිබුණි. | සේවක හිඟය හේතුවෙන් වර්ගීකරණ ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි. පියවර ගනු ලැබේ. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදය අනුගමනය කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | සභාව විසින් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව නිලධාරීන්ට පුහුණුවීම් කිසිවක් ලබාදී නොතිබුණු අතර කම්කරුවන් 02දෙනෙකුට වාර්ෂිකව සිදුකළ යුතු වෛද්‍ය පරීක්ෂණයන්ද සිදුකර නොතිබුණි. | ඉදිරියේදි නිලධාරීන්ට පුහුණුවීම් ලබාදීමට කටයුතු කරනු ලැබේ. | පුහුණුවීම් ලබාදිය යුතු අතර වෛද්‍ය පරීක්ෂණයන්ද සිදු කළ යුතුවේ. |
| (iv) | දෛනිකව රැස් කරන අපද්‍රව්‍ය පස් තට්ටුවකින් නොවැසීම නිසා මැසිමදුරුවන් බෝවීම පහසුවෙන් සිදුවිය හැකි අතර පරිසරය දුර්ගන්දයෙන් පිරී ඇත. | සත්ව අපද්‍රව්‍ය වලවල් හාරා එහි වලදැමීමට කටයුතු කර ඇත. | පරිසරයට හානියක් නොවන අයුරින් ක්‍රියා කළ යුතුවේ. |

**(ඉ) පාරිසරික ගැටළු**

-------------------

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------- | -------------------------- |
| (i) | අපද්‍රව්‍ය වෙන් කළ හැකි වෙන වෙනම පොදි කිරිමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකර රැස්කරන අපද්‍රව්‍ය ගිනි තැබීම හේතුවෙන් පරිසරය දූෂණයට ලක් වේ. | අදාල විෂයය සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගනු ලැබේ. | පරිසරයට හානියක් නොවන අයුරින් අපද්‍රව්‍ය ඉවත් කළ යුතුවේ. |
| (ii) | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරා ගෙන තිබූ ප්‍ර දේශයේ මැසිමදුරුවන් බෝවීම වැලැක්වීම සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්දය වැලැක්වීමට ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | අදාල විෂයය සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගනු ලැබේ. | පරිසරය ආරක්ෂා කිරීමට පියවර ගත යුතුවේ. |

**(ඊ) තිරසාර සංවර්ධන ඉලක්ක**

------------------------------

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ----------------- | ----------------------- |
| තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ දීර්ඝකාලීන පදනමින් සැලැසුම් සකස් කර නොතිබුණි. | මෙම වර්ෂයේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. | දීර්ඝකාලීන සැලැසුම් සකස් කළ යුතුවේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ---------------- | ------------ |
| (i) | පළාත් වෙන්කළ නිෂ්චිත අරමුදල් යටතේ රු.3,398,505ක් වටිනාකමට ප්‍රතිසංස්කරණය කළ තම්බගාමම් අරසර්කේනි සම්බන්ධ කිරීමේ මාර්ගයේ දීර්ඝ කොටසක් විශාල ලෙස හානියට පත්ව මහජන උපයෝජනය සඳහා යොදාගත නොහැකිව පැවැතිණි. | වර්තමානයේ නැවත ප්‍රතිසංස්කරණය කර ඇත. | මාර්ග ඉදිකිරීමේ අරමුණ ඉටුවිය යුතුවේ. |
| (ii) | 2015 ඔක්තෝබර් 27 දින සිදුවූ වාහන අනතුර හේතුවෙන් වාහන අළුත්වැඩියාවට රු.674,407ක ගෙවීම් සිදු කර තිබුණි. මෙයින් රක්ෂණ සමාගමෙන් රු.526,407ක් ලැබී තිබූ අතර ඉතිරිය රු.147,820ක් සභාව විසින් අත්තිකාරම් ලබාදී තිබුණි. එනමුත්, අත්තිකාරම් ලෙස ලබාදුන් වාහන අනතුරෙහි පාඩුව රියැදුරුගෙන් අයකර ගැනීමට සභාව තීරණය කර තිබුණත්, මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | වර්තමානයේ රියැදුරුගෙන් කොටස් වශයෙන් අය කරමින් පවතී. | මූල්‍ය හා පරිපාලන රීති අනුව කටයුතු කළ යුතුවේ. |
| (iii) | තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු කිරීම් නොලබා කඩකාමර 23ක් ඉඩම් කුලි සඳහා ලබාදී සභාව විසින් කුලී අයකරමින් පැවතුණි. | පියවර ගනිමින් පවතී. | තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු කිරීම් ප්‍රකාරව ක්‍රියා කළ යුතුවේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ---------------- | ----------------- |
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 76 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 58 ක් වශයෙනුත් පැවති අතර මේ දක්වා පුරප්පාඩුව පවතින තනතුරු 18 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. | පුරප්පාඩු පිරවීමට නියමිත කාලය තුළ ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පසුගිය වර්ෂවල මුදල් ශේෂයේ සිදුවූ වැඩිවීම රු.242,989ක් සඳහා පසුගිය වර්ෂ මුදල් සතොක්ෂණයේදි අදාල මුදල් ශේෂය නොදක්වා සමාලෝචිත වර්ෂයේදි සමුච්චිත අරමුදල් ගිණුමට හර කිරීම නිසා සමුච්චිත අරමුදල අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2018 වර්ෂයේ මුදල් ශේෂය ද්විගණනය වීම නිසා 2019 වර්ෂයේ සමුච්චිත අරමුදල් ගිණුමෙන් නිවැරදි කර ඇත. | අදාල ගිණුම්වල නියමිත කාලය තුළ නිවැරදි කිරීම් සිදු කළ යුතුවේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛනගත කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ ධාවන තත්ත්වයේ පවතින වාහන 17ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | කටයුතු කරමින් පවතී. | අයිතිය පැවරීම් සිදු කළ යුතුය. |

**3.5.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජල බවුසර් 02ක්, ට්‍රේලර් සහ Gully Bowser 01ක් ආදිය මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොකර තිබූ අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ආදායම් බලපත්‍රද ලබා ගෙන නොතිබුණි. එසේම රක්ෂණාවරණයත් ලබාගෙන නොතිබුණි. | නැවත පදිංචි කිරීමේදි කිසිදු ලේඛනයක් නොමැතිව ලැබී තිබුණි. එමනිසා ලියාපදිංචි කළ නොහැකි වී ඇත. | ලියාපදිංචි කළ යුතු අතර රක්ෂණාවරණයද ලබාගත යුතුවේ. |

**3.5.3 නඩත්තුව හා අලුත්වැඩියා කිරීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක RB – 9600 දරන ට්‍රැක්ටරය 2019 අගෝස්තු මාසයේ සිට හානියට පත්වී භාවිතා කළ නොහැකි තත්ත්වයේ පැවතුණි. | අලුත්වැඩියා ඇස්තමේන්තුව ලැබී ඉංජිනේරුවරයාගේ නිර්දේශය සඳහා යවා ඇත. | වාහන ධාවනය කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විමධ්‍යගත සහ පළාත් වෙන්කළ අරමුදල් යටතේ මූලධන ව්‍යාපෘති ගිවිසුම් කාලය තුළ අවසන් නොකර කොන්ත්‍රාත්කරු විසින් ලබාදෙන කල්දීම් සමග කාර්යය අවසන් කර තිබුණත් ප්‍රාදේශීය පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ නොලැබීම නිසා කාලය දීර්ඝ කිරීම් නියමිත කාල පරාසය සඳහා ලබාදී නොතිබුණි. එසේම කාලය ප්‍රමාද කිරීමේ ගාස්තුත් අයකිරීමද සිදු කර නොතිබුණි. | අවසන් ගෙවීම් සිදුකිරීමේදී දඩ ගාස්තු අයකිරීමෙන් පසුව පමණක් ගෙවීම් සිදු කරනු ලබයි. | කාලය ප්‍රමාද වීමේ දඩ ගාස්තු අයකළ යුතුවේ. |

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයවැය සැලැස්මෙන් ප්‍රතිපාදන සලසා තිබූ කාර්යය වෙනස් කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ විනායගපුරම් සහ කරන්තායි ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැය මගින් ප්‍රතිපාදිත කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුවේ. | විනායගපුරම් ප්‍රදේශයේ සභාවේ අරමුදල්වලින් නොවන වෙනත් අරමුදල් මූලාශ්‍රවලින් එහි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වීම නිසා සභාවේ අරමුදලින් වූ කාර්යයන් සිදු නොකෙරුණි. |